din-08-13-uns-891P-35x4-pnf-2

**ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය**

**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC)**

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

# ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB) කොන්ත්‍රාත්තුව

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ (CFHC) "සයුරු" ඩ්‍රෙජර් යාත්‍රාව සඳහා නවතම, අධි-ධාරිතා යාන්ත්‍රික ග්‍රැබ් බකට් (Grab Bucket) 01 ක් (2.5 $m^3$ – ටොන් 6) සැපයීම, ගෙනවිත් භාරදීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කරවීමේ ප්‍රසම්පාදනය

## කොන්ත්‍රාත් අංකය : CFHC/PD/GRBUKT/SAYURU/2026-51

1. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ "එම්.වී. සයුරු" ඩ්‍රෙජර් යාත්‍රාව සඳහා නවතම අධි-ධාරිතා යාන්ත්‍රික ග්‍රැබ් බකට් (Grab Bucket) 01ක් (2.5 $m^3$ – ටොන් 6) සැපයීම, ගෙනවිත් භාරදීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කර භාරදීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. මෙම ප්‍රසම්පාදනයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ලංකා රුපියල් මිලියන 20කි.
3. 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල සඳහන් කර ඇති ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය (NCB – තනි අදියර තනි කවරය ලංසු තැබීමේ ක්‍රමවේදය) ඔස්සේ ලංසු තැබීම සිදු කරනු ලබන අතර, මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා මෙය විවෘත වේ.

   අ) **කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට , සාර්ථක ලංසුකරු හෝ මෙම ප්‍රසම්පාදනයේ නිෂ්පාදකයා තම ව්‍යාපාරික කටයුතු, ගිවිසුම්ගත කාර්යසාධනය, වංචා, දූෂණ හෝ වෘත්තීය අතපසුවීම් සම්බන්ධයෙන් කිසිදු රටක අදාළ අධිකරණමය, නියාමන හෝ පාලන තහනම් කිරීම්, අත්හිටුවීම් හෝ අසාධු ලේඛනගත කිරීමකට ලක්ව නොතිබිය යුතුය.**

   ආ) සාමාන්‍ය පළපුරුද්ද

   i. ලංසුකරුට අධි-ධාරිතා යාන්ත්‍රික ග්‍රැබ් බකට්, ඩ්‍රෙජිං උපකරණ, සාගර කොකු/ක්‍රේන් (marine cranes), වරාය මෙහෙයුම් උපකරණ හෝ ඒ හා සමාන සාගර ද්‍රව්‍ය හසුරුවන පද්ධති සැපයීම, ක්‍රියාත්මක කර භාරදීම, නඩත්තුව හෝ මෙහෙයුම් පිළිබඳ අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.

   ii. ඉදිරිපත් කරනු ලබන ග්‍රැබ් බකට් එකෙහි නිෂ්පාදකයාට අධි-ධාරිතා යාන්ත්‍රික ග්‍රැබ් බකට් හෝ ඊට සමාන ඩ්‍රෙජිං සහ සාගර මෙහෙයුම් උපකරණ සැලසුම් කිරීම, නිෂ්පාදනය සහ සැපයීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.

   iii. ශ්‍රී ලාංකික ලංසුකරුවන් හෝ දේශීය නියෝජිතයන් විසින් (අදාළ වන්නේ නම්) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත හෝ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

   iv. විදේශීය ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ක්‍රියාත්මක වන බලයලත් දේශීය නියෝජිතයෙකු මාර්ගයෙන් පමණි. දේශීය නියෝජිතයා, ඒකාබද්ධ ව්‍යාපාර (JV) ගිවිසුමක් සහ නිෂ්පාදකයාගේ බලපත්‍ර ලිපියක් හරහා නිෂ්පාදකයා හෝ විදේශීය ලංසුකරු විසින් නිසි පරිදි බලය පවරන ලද අයෙකු විය යුතුය. අලෙවියෙන් පසු සේවා, තාක්ෂණික සහාය, වගකීම් සහතික කිරීමේ වගකීම් සහ මිලදී ගන්නා පාර්ශ්වය සමඟ සන්නිවේදනය ඒකාබද්ධ කිරීම සඳහා දේශීය නියෝජිතයා වගකිව යුතුය.

   ඇ) සමාන කොන්ත්‍රාත් පිළිබඳ විශේෂිත පළපුරුද්ද

   i. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනට පෙර ගතවූ වසර පහ (05) ඇතුළත අධි-ධාරිතා යාන්ත්‍රික ග්‍රැබ් බකට්, සාගර උපකරණ, සාගර කොකු/ක්‍රේන් හෝ සමාන බර ඉසිලීමේ/ද්‍රව්‍ය හසුරුවන උපකරණ සැපයීම සහ ක්‍රියාත්මක කර භාරදීම සම්බන්ධ ගිවිසුම් අවම වශයෙන් දෙකක් (02) වත් ලංසුකරු විසින් සාර්ථකව නිම කර තිබිය යුතුය.

   ii. සෑම කොන්ත්‍රාත්තුවකම අවම වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 20කට (ලංරු. මිලියන 20) හෝ ඊට සමාන නිදහසේ පරිවර්තනය කළ හැකි විදේශීය මුදලකට නොඅඩු විය යුතුය.

   ඈ) නිෂ්පාදකයාගේ පළපුරුද්ද

   i. ඉදිරිපත් කරනු ලබන ග්‍රැබ් බකට් මාදිලිය සහ වෙළඳ නාමය ජාත්‍යන්තර හෝ දේශීය සාගර, ඩ්‍රෙජිං, වරාය, කාර්මික හෝ බර ද්‍රව්‍ය හැසිරවීමේ යෙදවුම්වල ප්‍රායෝගිකව භාවිතා කර ඇති පළපුරුද්දක් තිබිය යුතුය.

   ii. ඉදිරිපත් කරන ලද වෙළඳ නාමය සහ මාදිලිය සමාන යෙදවුම්වල අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක මෙහෙයුම් ඉතිහාසයක් තිබිය යුතුය.

   ඉ) තත්ත්ව සහතිකය සහ ප්‍රමිතීන්

   i. ඉදිරිපත් කරන උපකරණ සාගර ඩ්‍රෙජිං උපකරණ සහ ඉසිලීමේ යන්ත්‍ර සඳහා අදාළ වන ISO, DIN, JIS, ASTM, FEM හෝ ඊට සමාන ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

   ii. නිෂ්පාදකයා සතුව වලංගු ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය හෝ ජාත්‍යන්තරව පිළිගත් ඊට සමාන සහතිකයක් තිබිය යුතුය.

   ඊ) මූල්‍ය හැකියාව

   i. ලංසුකරු පසුගිය මූල්‍ය වසර තුන (03) ඇතුළත සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම ශ්‍රී ලංකා රුපියල් මිලියන 40කට (ලංරු. මිලියන 40) නොඅඩු හෝ ඊට සමාන නිදහසේ පරිවර්තනය කළ හැකි විදේශීය මුදලක් ලබාගෙන තිබිය යුතුය.

   ii. මෙම ව්‍යාපෘතිය සඳහා ලංසුකරු රුපියල් මිලියන 20ක (ලංරු. මිලියන 20) කාරක ප්‍රාග්ධනයක් පෙන්විය යුතුය.

   උ) වැඩපොළ පහසුකම් සහ තාක්ෂණික සහායක හැකියාව

   i ලංසුකරු හෝ ඔහුගේ බලයලත් දේශීය නියෝජිතයා සතුව ස්වයංක්‍රීය යන්ත්‍රෝපකරණ පහසුකම්, තාක්ෂණික කාර්ය මණ්ඩලය, මෙවලම්, ටොන් 06ක ග්‍රැබ් බකට් එකක් හැසිරවීමට අවශ්‍ය ඉසිලීමේ උපකරණ සහ ඉදිරිපත් කරන ලද ග්‍රැබ් බකට් උපකරණවලට අදාළ වැළැක්වීමේ නඩත්තු, නිවැරදි කිරීමේ නඩත්තු, අලුත්වැඩියා කටයුතු, ප්‍රතිසංස්කරණ සහ හදිසි බිඳවැටීම් සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සහිත සුදුසු වැඩපොළවල් ශ්‍රී ලංකාව පුරා තිබිය යුතුය.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **වැඩබලන කළමනාකාර (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, තැ.පෙ. 1747, රොක් හවුස් පාර, කොළඹ 15** ලිපිනයෙන් හෝ දුරකථන: 0112525063, විද්‍යුත් තැපැල: suppliescfhc@gmail.com හරහා ලබාගත හැකි අතර, 2026.08.13 සිට 2026.09. 07 දක්වා වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ප්‍රසම්පාදන ලේඛනය නොමිලේ පරීක්ෂා කළ හැක.
5. ප්‍රසම්පාදන ලේඛනයේ මුද්‍රිත පිටපතක් 04 වන ඡේදයේ සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. සුදුසුකම් ලැබීම සඳහා, ලංසුකරුවන් රුපියල් 5,000.00ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවිය යුතුය. එම ගාස්තුව ඉහත ලිපිනයේ පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා අයකැමි වෙත ගෙවිය යුතුය. මුල් ගෙවීම් පත්‍රිකාව හෝ සංස්ථාවේ නිල ලදුපත ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.
6. ලංසු 2026.09.08 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ඉහත ලිපිනයට (4 ඡේදය) ගෙනෙවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2026.09.08 දින පෙ.ව. 11.00 ට ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
7. සියලුම ලංසු සමඟ බැංකු ඇපකරයක් ආකාරයෙන් ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය ශ්‍රී ලංකා රුපියල්වලින් ලක්ෂ දෙකක් (රු. 200,000.00) සඳහන් කළ යුතුය.
8. පූර්ව ලංසු රැස්වීමක් 2026.08.25 දින පෙ.ව. 10.30ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල ර රැස්වීම් කාමරයේදී (අංක 15, තැ.පෙ. 1747, රොක් හවුස් පාර, කොළඹ 15) පැවැත්වේ. කැමැත්තක් දක්වන සියලුම ලංසුකරුවන්ට මෙම පූර්ව ලංසු රැස්වීමට සහභාගී විය හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC),**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC),**
**අංක 15, තැ.පෙ. 1747, රොක් හවුස් පාර, කොළඹ 15.**